**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය -2021**

**-----------------------------------------------------------------**

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**---------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, නාවික හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් හිමිවන මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩිදියුණු කිරීම සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ පළල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව,ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 7,121.32 කට සමාන එ.ජ.ඩො. මිලියන 62.46 ක් වූ අතර ඉන් රු. මිලියන 4,560 කට සමාන එ.ජ.ඩො. මිලියන 40 ක් මූල්‍යනය කිරීමට අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. රු.මිලියන 2,561.32 කට සමාන එ.ජ.ඩො. මිලියන 22.46 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කල යුතුය. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්වාගණනය කළ මතය**

**-----------------------------**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**-------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක. 08 ප්‍රකාරව, ඉඩම් අත්පත් කර ගැනීම මත 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා ඉඩම් කට්ටි 2,271 ක් සඳහා වන්දි මුදල් සහ ඉඩම් කට්ටි 2,716ක් සඳහා ප්‍රමාද පොලී හඳුනාගෙන නොතිබුණි. | එකඟ වෙමි. 2022 වර්ෂයේ පොලී ගෙවීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිපාදන සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සහ මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ණය මුදලින් රු. මිලියන 75.5 ක මුළු වියදමක් දරා තිබුණි. එහෙත් ඊට අදාළ මුදල රු. මිලියන 52.7ක් ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල දක්වා තිබුණි. ඊට අමතරව, රු. මිලියන 23 ක් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ණය යටතේ සටහන් කරනු වෙනුවට වියදම් කළ හැකි විදේශ ආධාර ලෙස පෙන්වා තිබුණි. | 2022 වර්ෂයේ සිට විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාව සංසන්දනය කිරීමට සටහන් කරගතිමි. | ශේෂසැසදීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය. | චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව 2021 වර්ෂය තුළ රැස්වී නොතිබුණි. | එකඟවෙමි. | සියලුම මෙහෙයුම් කමිටු චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 04ක් අවසන් කිරීමෙන් පසු, ඒ 005 පේරාදෙණිය - බදුල්ල චෙන්කලඩි මාර්ගයේ 0+420 සිට 3+050 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම 2017 ජූනි 09 දින ආරම්භ කරන ලද අතර 2018 ජූනි 08 දින අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2021 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 126.53ක මුළු පිරිවැයක් දරා තිබුණු අතර එයින් රු. මිලියන 58.23ක වියදමක් 2017 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා කාලය සඳහා වැය කර තිබුණි.කෙසේ වෙතත්, එය දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් 2021 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණු අතර අමතර ව්‍යාපෘති පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු සියයට 95.2 ක ප්‍රගතියක් ලබාගෙන තිබුණි. | ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පළමු කාලය දීර්ඝ කිරීමෙන් පසුව තවදුරටත් කාලය දීර්ඝ කිරීම් ලබා දී නොතිබුණද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින දක්වා මූලික සහ සාමාන්‍ය ගෙවීම් අයිතම සඳහා රු. මිලියන 85ක් ඇතුළුව අතුරු ගෙවීම් සහතික මගින් රු.මිලියන 354ක් ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 8.7 උප වගන්තිය අනුව කොන්ත්‍රාත්කරුගෙන් රු. මිලියන 40.77ක් වූ උපරිම ප්‍රමාද ගාස්තුවක් අය කිරීමට ව්‍යාපෘතිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ නිවේදනය නිකුත් කළ අවස්ථාව වන විට අයකරගත් ප්‍රමාද ගාස්තුව රු. මිලියන 27 ක් විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු මාස 06 කින් ව්‍යාපෘතිය අවසන් කිරීමට එකඟ වී ඇති අතර අයකරගත් ප්‍රමාද ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව, මා.සං.අ. සභාපතිවරයා විසින් එය නිදහස් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. | පාඩු අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසි පිළිපැදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් "කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ පූර්ව දැනුම්දීම" මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත 2019 ජුනි 18 දින යවා තිබුණි. කෙසේ වෙතත්, පහසුකම් සපයන්නෙකු සමඟ ඉදිකිරීම් සිදු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම සලකා බලා, 2019 ජූලි 01 දින පුනරුත්ථාපන කටයුතු නැවත ආරම්භ කර තිබුණි. තවද, සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වූ බැවින්, 2019 මැයි මාසයේ අතුරු ගෙවීම් සහතිකයෙන් රු. මිලියන 27 ක ප්‍රමාද ගාස්තු අය කිරීමට උපදේශකවරයා නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 8.7 උප වගන්තිය සැලකිල්ලට නොගෙන, 2019 අගෝස්තු 20 දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව එම මුදල ප්‍රමාද ගාස්තු ලෙස අය නොකිරීමට සේවායෝජකයා තීරණය කර තිබුණි. ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත්කරුට අමතර මූල්‍ය පහසුකම් සපයා ඇති අතර ව්‍යාපෘතිය අවසානයේ දී පවා ප්‍රමාද ගාස්තු අය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | එකඟවෙමි. | පාඩු අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අදාළ කොන්ත්‍රාත්කරුගේ වියදමින් කාර්ය සාධන බැඳුම්කර ලබාගත යුතු බවට වූ කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන බැඳුම්කර ලබා ගැනීමේ පිරිවැය සඳහන් කිරීමට ඉඩ සලසමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතම සකස් කර තිබුණි. ඒ අනුව පේරාදෙණිය - බදුල්ල චෙන්කලඩි පාරේ කොන්ත්‍රාත්කරු ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියනයක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට එකවර ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුට එකවර ගෙවීමක් ලෙස වෙනම ගෙවීම් අයිතමයක් මගින් හිමිකම් පෑමට අවසර තිබේ නම්, සේවායෝජකයාට කොන්ත්‍රාත්කරු සමඟ එකඟතාවයකට පැමිණ කාර්ය සාධන බැඳුම්කර, රක්ෂණ, අත්තිකාරම් බැඳුම්කර යනාදිය ලබා ගැනීම සඳහා දරන ලද සත්‍ය පිරිවැය තක්සේරු කළ හැකි අතර, කොන්ත්‍රාත් මිල වැඩි වීම වළක්වා ගත හැකිය. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය සිදු කළ යුතු වේ. |

**3.3 ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2013 වර්ෂයේදී ආරම්භ කර සති 26ක් තුළ කඩිනමින් අවසන් කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට රු. මිලියන 1.82ක දිරි දීමනා ගෙවා තිබුණද,ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතුණි. | විවිධ හේතු නිසා ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයක් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලැබී තිබුණු තොරතුරුවලට අනුව ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 2,959ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. එයින් ඉඩම් කට්ටි 688ක් සඳහා රු.මිලියන 244.5ක් වන්දි වශයෙන් ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 165ක් සඳහා පමණක් ප්‍රමාද පොලී ලෙස රු.මිලියන 31.51ක් ගෙවා තිබුණි. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව 2021 දෙසැම්බර් 31 දිනට පවා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණේ ඉඩම් කට්ටි 146ක් පමණි. | එකඟවෙමි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |